# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 392 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 07/03/2024
පැය 0800

## මාධ්‍ය නිවේදනය

**වෛද්‍යවරයෙකු ලෙස ව්‍යාජව පෙනී සිටිමින් නීති විරෝධී ලෙස වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන ගිය සැකකරුවෙකු අත්අඩංගුවට - බියගම පොලිස් ස්ථානය.**

2024.03.06 වන දින බියගම පොලිස් වසමේ බණ්ඩාරවත්ත, බියගම ලිපිනයේ පිහිටා ඇති **"මාස් මෙඩිකල් සර්විස්"** යන නමින් සුදුසුකම් නොලත් වෛද්‍යවරයෙකු විසින් වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යන බවට බියගම පොලිස් ස්ථානයට තොරතුරක් ලැබී ඇත.

ඒ අනුව 2024.03.06 වන දින දහවල් කාලයේදී බියගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් එම වෛද්‍ය මධ්‍යස්ථානය වැටලීමක් සිදුකර ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වෛද්‍යවරයෙකු ලෙස අනුමත ලියකියවිලි කිසිවක් නොමැතිව වෛද්‍යවරයෙකු ලෙස ව්‍යාජව පෙනී සිටිමින් නීති විරෝධී ලෙස වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වගෙන ගිය සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 66ක් වන බියගම ප්‍රදේශයේ පදිංචි ගුණහේරත් මුදියන්සේලාගේ සමන් බංඩාර ගුණහේරත් යන අය වේ.**

මේ සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී ඉහත වෛද්‍ය ආයතනය 2017 වර්ෂයේ ලියාපදිංචි කර ඇති බවත්, එම ලියාපදිංචි වෛද්‍යවරයා 2023 වර්ෂයේ ජූලි මස විදේශ ගතව ඇති බවත්, අනතුරුව එම වෛද්‍යවරයාගේ පියා විසින් මේ දක්වා විදේශ ගතවන ලද ඔහුගේ පුතාගේ නම ව්‍යාජව භාවිතා කර වෛද්‍යවරයෙකු ලෙස පෙනී සිටිමින් එම වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානය පවත්වා ගෙන ගොස් ඇත. එමෙන්ම මෙම සැකකරු වෛද්‍යවරයෙකු ලෙස වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමක් හෝ වෛද්‍යවරයෙකු ලෙස ක්‍රියා කිරීමට කිසිදු සුදුසුකමක් නොමැති අයෙකු බවටද වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇත.

සැකකරු මහර ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. බියගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**